SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ග

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

| ශ්‍රේණිය Grade | 12 | විෂයය Subject | ආර්ථික විද්‍යාව I | කාලය Time | පැය 02 |
|---|---|---|---|---|---|
| නම பெயர் Name | | | | | |

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය වනුයේ,
1. ආර්ථික විද්‍යාවේදී හඳාරනු ලබන්නේ සම්පත් හිඟකම හා තෝරා ගැනීම පිළිබඳවය.
2. සම්පත් වල හිඟකමක් පවතින බැවින් සෑම සමාජයක්ම පවත්නා සම්පත් වල විකල්ප භාවිතා අතර තේරීමක් කළ යුතුය.
3. මිනිස් අවශ්‍යතා වලට සාපේක්ෂව සම්පත් හිඟවීම සහ සම්පත් විකල්ප ඇසුරින් භාවිත කළ හැකි වීම නිසා තෝරා ගැනීමට සිදු වේ.
4. සම්පත් හිඟකම නිසා සම්පත් වල භාවිතා ප්‍රමාණය ඉක්ම වූ සම්පත් ප්‍රමාණයක් දක්නට ලැබේ.
5. මිනිස් වුවමනාවක් අසීමිතව පවතිනතාක් සහ සම්පත් සීමිතව පවතිනතාක් හිඟකම ප්‍රශ්නය නොවිසඳෙනු ඇත.

(02) පහත සඳහන් ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී ප්‍රකාශය වන්නේ,
1. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය මිලියන 21 පමණ වේ.
2. අපරාධ ඉහළයාමට දරිද්‍රතාවය ප්‍රභල හේතුවක් වේ.
3. පසුගිය දා සිදු වූ නාය යාම පරිසර හායනය බව තහවුරු විය.
4. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ගොඩනැගීමට නම් පරිපාලනය වෙනස් විය යුතුය.
5. ශ්‍රී ලංකාවේ දුම්පානය උගත් අයට වඩා නූගත් අය අතර බහුලව පවතී.

(03) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් යථානුරූපී සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශය තෝරන්න.
1. වෙළඳපලට අධි ඉල්ලුමක් හා අධි සැපයුමක් ඇතිවිට සමතුලිත මිල වෙනස්වීමේ නැඹුරුවක් පවතී.
2. 2020 වර්ෂයේ නැගී ගෙන එන වෙළඳපල ආර්ථිකය 4.1% සාමාන්‍ය වෘද්ධියක් අත් කරගෙන ඇත.
3. රටෙහි දරිද්‍රතා අනුපාතිකය ඉහළ ගොස් ඇත.
4. පෙර නොවූ ලෙස මුදලේ බාහිර අගය පහළ ගොස් ඇත.
5. රජය නව බදු පනත් හඳුන්වා දී ඇත.

(04) පෞද්ගලික විශ්ව විද්‍යාලයක ඉගෙනීමේ ආවස්ථික පිරිවැයක් නොවන්නේ,
1. පාඨ මිලට ගැනීමේ වියදමයි.
2. පාඨමාලා ගාස්තුවයි.
3. උපයා ගත හැකිව තිබූ ආදායම ඉහළ යාමයි.
4. අසනීපයක් වෙනුවෙන් බෙහෙත් මිලදී ගැනීමට දැරූ වියදම
5. පෑන් පැන්සල් හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට දරන වියදම

(05) ආර්ථික භාණ්ඩයක් යනු,
1. නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයක් හටගන්නා භාණ්ඩයකි.
2. නිෂ්පාදනයේදී සම්පත් උපයෝජනය නොකරන භාණ්ඩයකි.
3. තරඟකාරී ලෙස සපයනු ලබන භාණ්ඩයකි.
4. නිෂ්පාදනයේදී ලාභයක් උපයන භාණ්ඩයකි.
5. ශූන්‍ය මිලකදී වුවද ලබාගත හැකි භාණ්ඩයකි.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(06) නිෂ්පාදන සාධක වල පොදු හිමිකම, තීරණ ගැනීම කේන්ද්‍ර ගත වීම යන ලක්ෂණ වලින් සමන්විත ආර්ථික පද්ධතිය,

1. වෙළඳපල ආර්ථිකය
2. සාම්ප්‍රදායික ආර්ථිකය
3. සමාජීය වෙළඳපල ආර්ථිකය
4. මධ්‍ය සැලසුම් සහිත ආර්ථිකය
5. ධනවාදී ආර්ථික පද්ධතිය

(07) පහත සඳහන් දෑ අතුරින් ආවස්ථික පිරිවැයක් ජනිත නොවන්නේ කවර භාණ්ඩයක් පාරිභෝජනය සම්බන්ධයෙන්ද?

1. ගිෆන් භාණ්ඩයක් සම්බන්ධයෙන්
2. නිච භාණ්ඩයක් සම්බන්ධයෙන්
3. ආර්ථික භාණ්ඩයක් සම්බන්ධයෙන්
4. නොමිල භාණ්ඩයක් සම්බන්ධයෙන්
5. තමා විසින්ම නිපදවාගත් භාණ්ඩයක් සම්බන්ධයෙන්

(08) පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන සාධකයක් වනුයේ,

1. ආයතනය විසින් උපයනු ලබන ලාභය
2. ආයතනය සතු බැංකු ගිණුම්වල පවතින මුදල්
3. ශ්‍රමයේ ඵලදායිතාවය
4. ප්‍රචාරණය සහ රක්ෂණය සඳහා දරණ වියදම්
5. ආයතනයට අයත් හා කුලියට ලබාගත් ඉඩම්

(09) සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. සමාජ වරණයට අනුකූල වන ආකාරයට භාණ්ඩ හා සේවා සංයෝග නිපදවීමට හිඟ සම්පත් බෙදා හැරීම.
2. දරිද්‍රතාවය අවම වන ආකාරයට භාණ්ඩ නිපදවීමට සම්පත් බෙදා හැරීම.
3. මිල අඩු සම්පත් වැඩියෙන් හා මිල වැඩි සම්පත් අඩුවෙන් යොදා ගන්නා නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීමයි.
4. ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම වන ආකාරයට සම්පත් නිෂ්පාදන කාර්යයන් අතර බෙදා හැරීමයි.
5. යෙදවුම් ඒකකයකින් උපරිම නිමවුමක් ලැබෙන සේ නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීමයි.

(10) පහත දී ඇති සම්පත් අතරින් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පතක් ලෙස සැලකිය හැක්කේ,

1. ස්වාභාවික සම්පත්
2. ඛනිජ තෙල්
3. වන සතුන්
4. මිනිරන්
5. ගල් අඟුරු

(11) ආර්ථික සම්බාධක පැනවීමටත් හේතු කොටගෙන රටක නිෂ්පාදන විභතාව කාර්යක්ෂමව උපයෝජනය නොවීමක් සිදුවුවහොත් එය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක පිළිබිඹු කරනුයේ,

1. ඇතුළත ලක්ෂයක කටයුතු කිරීම මඟිනි
2. වමට විතැන් වීම මඟිනි
3. පිටත පිහිටි ලක්ෂයක් මඟිනි
4. දකුණට විතැන් වීම මඟිනි
5. මත ලක්ෂයක කටයුතු කිරීම මඟිනි

(12) මෙම සංඛ්‍යා ලේඛනයට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

| නිමවුම් සංයෝගය | සහල් (ඒකක) | තිරිඟු (ඒකක) |
|---|---|---|
| A | 0 | 10 |
| B | 2 | 9 |
| C | 4 | 7 |
| D | 6 | 4 |
| E | 8 | 0 |

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

1. සහල් නිෂ්පාදනය වැඩිවන විට එහි ආවස්ථික පිරිවැය අඩු වේ.
2. තිරිඟු නිෂ්පාදනය වැඩිවන විට එහි ආවස්ථික පිරිවැය අඩු වේ.
3. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බෑවුම සෑම තැනම ස්ථාවර වේ.
4. සහල් සහ තිරිගු වලට අදාළව අදින ලද නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වැඩෙන ආවස්ථිත පිරිවැයක් පිළිඹිබු කරයි.
5. B සිට C දක්වා නිමවුම් සංයෝග මාරු වීමේදී සහල් වල ආන්තික ආවස්ථික පිරිවැය 02 කි.

(13) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් වමට විතැන් වීමට හේතුවක් නොවන්නේ,

1. දැඩි නියගයක් නිසා වගා බිම් විනාශ වීම
2. ආර්ථික අවපාතයකට මුහුණ දීම
3. ආර්ථික සම්බාධක ඉවත් කිරීම
4. වැඩ වර්ජන නිසා කර්මාන්තශාලා නිමවුම පහළ යාම
5. කළමණාකරණ ගැටළු හේතුවෙන් ශ්‍රම ඵලදායිතාවය පහත වැටීම

(14) ආර්ථික පද්ධතියක කාර්යය සාධනය මිනුම් කිරීමේදී යොදා ගැනෙන නිර්ණායකයක් නොවන්නේ,

1. ආර්ථික වර්ධනය
2. ආර්ථික කාර්යක්ෂමතාවය
3. ආර්ථික ස්ථායිතාවය
4. ආර්ථික නව්‍යකරණය
5. ආදායම් ව්‍යාප්ති සාධාරණත්වය

(15) පහත කවර අවස්ථාවකදී ආවස්ථිත පිරිවැය ශුන්‍ය වේද?

1. විදුලිබල උත්පාදන යන්ත්‍රයක් විදුලිබල උත්පාදක ක්‍රියාවලියට භාවිතා කරන විට
2. කුරුඳු වගාව ඉවත්කර එම බිම තේ වගාවට යොදා ගැනීම
3. රජය විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් ගෙවන විට
4. ශිෂ්‍යයකු කිසියම් විෂයය ධාරාවක් තෝරාගත් විට
5. වැව් ජලය යොදාගෙන වගාකරන විට

(16) නිෂ්පාදන හැකියා මායිම ගොඩ නැගීමේදී පදනම් කරගනු ලබන ප්‍රධාන උපකල්පනයක් වනුයේ,

1. ආවස්ථිත පිරිවැය වැඩි වන බව
2. සම්පත් බෙදී යාම සමාජ වරණ හා ඇගයීම මත
3. සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කරන බව
4. ආර්ථිකය හිඟකම ප්‍රශ්නයට මුහුණ දෙන බව
5. සම්පත් සම්භාරය විවිධ කර්මාන්ත අතර බෙදා හැරීමේදී ආවස්ථිත පිරිවැය හටගන්නා බව

(17) "විධාන ආර්ථික ක්‍රමයක" කුමක් නිෂ්පාදනය කළ යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබන්නේ,

1. ස්වාර්ථය පදනම් කරගෙනය.
2. මිල යන්ත්‍රණය ලබාදෙන නියෝග මතය.
3. පාරිභෝගික ඉල්ලුම හා සැපයුම අනුවය.
4. පාරිභෝගිකයාගේ ක්‍රය ශක්තිය අනුවය.
5. රජය මඟින් ලබාදෙන නියෝග අනුවය.

(18) වෙළඳපල ආර්ථිකයක ලාභය මඟින් සිදුකරන කාර්යයක් වන්නේ,

1. ආර්ථිකයේ ශුභ සාධනයට සම්පත් බෙදාදීම.
2. ආර්ථිකයේ සම්පත් බෙදීයාම කාර්යක්ෂම කිරීම.
3. ආර්ථිකයේ පොදු භාණ්ඩ සඳහා සම්පත් බෙදා වෙන් කිරීම.
4. සානුබල සැපයීම.
5. මිල ස්ථායිතාවය තහවුරු කිරීම.

(19) අනෙකුත් කරුණු නොවෙනස්ම පවතින විට පාරිභෝගිකයන්ගේ මුදල් ආදායම සහ මූර්ත ආදායම යන දෙකම පහළ යන තත්ත්වයක් තුළ ඉල්ලුමද පහළ වැටේ නම්,

1. සුඛෝපභෝගී භාණ්ඩයක් විය යුතුය.
2. බාල භාණ්ඩයක් විය යුතුය.
3. ගිෆන් භාණ්ඩයක් විය යුතුය.
4. සාමාන්‍ය භාණ්ඩයක් විය යුතුය.
5. අත්‍යවශ්‍යය භාණ්ඩයක් විය යුතුය.

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

(20) භාණ්ඩයක මිල සහ සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයක් ඇතිවීමට හේතුවන සාධකය කවරේද?

1. සැපයුම්කරුවන්ගේ ලාභය
2. ආදේශක භාණ්ඩයක මිල
3. ඉල්ලුම්කරුගේ ආදායම
4. සැපයුම්කරුවන්ගේ අපේක්ෂා
5. ඉහත සාධක සියල්ලම

(21) එක්තරා වෙළඳපලක අලෙවිකරණ Z භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් විය. මේ සඳහා බලපා හැකි නිවැරදි සාධකය,

1. නිෂ්පාදන සාධක මිල අඩු වීම
2. නිෂ්පාදන සාධක මිල වැඩි වීම
3. පාරිභෝගික ආදායම අඩු වීම
4. පාරිභෝගික රුචිය වැඩිවීම
5. අනාගතයේ මිල පහල යන බවට අපේක්ෂා

(22) ඉන්ධන මිල ඉහළ දමන විට එහි ප්‍රවාහන වාර ගණන පහළ යන්නේ නම්,

1. මාර්ග ප්‍රවාහන සේවය සාමාන්‍ය භාණ්ඩයකි.
2. මාර්ග ප්‍රවාහන සේවය බාල භාණ්ඩයකි.
3. මාර්ග ප්‍රවාහන බස් ගාස්තු සාමාන්‍ය භාණ්ඩයකි.
4. ඉන්ධන සාමාන්‍ය භාණ්ඩයකි.
5. ඉන්ධන මිල හා එහි ප්‍රවාහනය අනුපූරක භාණ්ඩයකි.

(23) "ඉල්ලුමේ ඉහළ යාමක්" සිදු වෙතැයි අපේක්ෂා කළ හැක්කේ කළ හැක්කේ,

1. ඉහළ මිලකදී වැඩියෙන් ඉල්ලුම් කිරීම.
2. ඉහළ මිලකදී එකම ප්‍රමාණයන් මිලට ගැනීම.
3. මිල පහළ වැටුණද කලින් මිලට ගත් ප්‍රමාණය මිලට ගැනීම.
4. පාරිභෝගිකයන් ප්‍රමාණය වැඩි වීම නිසා ඉල්ලුම වැඩි වීම.
5. මිල ඉහළ යන විට ගුණත්වයද ඉහළ යතැයි අපේක්ෂා කිරීම.

(24) භාණ්ඩයක වෙළඳපල ඉල්ලුම වැඩි වන විට සැපයුමේ අඩු වීමක් සිදුවුවහොත් නිශ්චිතව සිදු වෙතැයි අපේක්ෂා කළ හැක්කේ,

1. වෙළඳපල මිල ඉහළ යාම.
2. සමතුලිත ප්‍රමාණය අඩු වීම.
3. සමතුලිත මිල සැපයුමට සංවේදීව එම දිශාවට වෙනස් වීම.
4. ඉල්ලුම වෙනස් වන දිශාවට මිල වෙනස් වීම.
5. සමතුලිත ප්‍රමාණය ඉල්ලුම වෙනස් වූ දිශාවට වෙනස් වීම.

(25) කිසියම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය ශුන්‍ය වන මිල රු.25 කි. උපරිම ඉල්ලුම් ප්‍රමාණය 50 කි. සැපයුම් සමීකරණය $Q_s = -10 + 4P$ වේ. මෙම භාණ්ඩයේ පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය,

1. රු.225, රු. 77.50
2. රු. 450, රු 197.50
3. රු. 200, රු 300
4. රු. 225, රු 112.50
5. රු.225 , රු. 75.50

(26) ආයතනික සැපයුම සහ වෙළඳපළ සැපයුම අතර වෙනස රඳා පවතින්නේ,

1. සලකා බලන භාණ්ඩයේ මිල
2. සම්බන්ධිත භාණ්ඩ මිල
3. වෙළඳපොල සිටින නිෂ්පාදකයන් සංඛ්‍යාව
4. යෙදවුම් මිල
5. රාජ්‍ය ප්‍රතිපත්ති

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(27) කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වෙළඳපොල ඉල්ලුම් ශ්‍රිතය $Q_d = 120 - 8P$ වශයෙන් ඇතැයි සලකන්න. ඉල්ලුම් වක්‍රය මත $P = 5$ වන ලක්ෂයේදී මිල ඉල්ලුම් නම්‍යතාවය කොපමණද?

1. -2
2. -1.5
3. -0.5
4. -0.33
5. -0.25

(28) කිසියම් භාණ්ඩයක අලෙවියෙන් ලැබෙන අයභාරය අඩු වන්නේ,

1. පාරිභෝගික ආදායම වැඩි වේ නම් සහ භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වේ නම් ය.
2. එම භාණ්ඩයේ මිල වැඩි වේ නම් සහ ඉල්ලුම අනම්‍ය වේ නම් ය.
3. එම භාණ්ඩයේ මිල වැඩි වේ නම් සහ ඉල්ලුම නම්‍ය වේ නම් ය.
4. එම භාණ්ඩයේ මිල අඩු වේ නම් සහ ඉල්ලුම නම්‍ය වේ නම් ය.
5. පාරිභෝගික ආදායම අඩු වේ නම් සහ භාණ්ඩය බාල භාණ්ඩයක් වේ නම්ය.

(29) සහල් වෙළඳපොලේ ඉල්ලුම් ශ්‍රිතය $Q_d = 500 + 10P$ සහ සැපයුම් ශ්‍රිතය $Q_s = -200 + 10P$ වේ. සමතුලිත වේ. සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාවය කොපමණද?

1. -1.2
2. -4.1
3. -0.5
4. -0.8
5. -2.3

(30) $Q_s = -10 + 2P$

$Q_s = 25 + 5P$

$Q_s = 15P$

ඉහත සැපයුම් සමීකරණ ඒවායේ නම්‍ය අනම්‍යතාවය අනුව අනුපිළිවෙලින් පෙළ ගැසුවහොත් නිවැරදි පිළිතුර වන්නේ,

1. අනම්‍ය, ඒකීය නම්‍ය, නම්‍ය
2. නම්‍ය, අනම්‍ය, ඒකීය නම්‍ය
3. ඒකීය නම්‍ය, නම්‍ය, අනම්‍ය
4. නම්‍ය, ඒකීය නම්‍ය, අනම්‍ය
5. ඒකීය නම්‍ය, අනම්‍ය, නම්‍ය

(31) $Q_s = 100 - 12P$ වන ආකාරයේ ඉල්ලුම් ශ්‍රිතයක් සහිතව භාණ්ඩ නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් නම්‍යතාවය ඒකීය වන විට සත්‍ය වන්නේ පහත කවර ප්‍රකාශයද?

1. අලෙවි අයභාරය උපරිම වේ.
2. අතිරික්තය උපරිම වේ.
3. ආර්ථිකය ලාභය උපරිම වේ.
4. අලෙවි ප්‍රමාණය උපරිම වේ.
5. නිෂ්පාදන පිරිවැය උපරිම වේ.

(32) කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරඟකාරී වෙළඳපොලක ඉල්ලුම හා සැපයුම් වක්‍ර එල සමීකරණය පහත දැක්වේ.

$Q_d = 120 - 20P$ $Q_s = -40 + 20P$

මෙම භාණ්ඩයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය නිසා නිමවුම් ඒකකයක රුපියල් 2/- වන සේ සහනාධාරයක් නිෂ්පාදකයින්ට ලබා දීමට රජය තීරණය කරයි. සහනාධාරය ලබාදුන් පසු පාරිභෝගික අතිරික්ත ප්‍රමාණය

1. රුපියල් 90 කි
2. රුපියල් 60 කි
3. රුපියල් 112.50 කි
4. රුපියල් 180 කි
5. රුපියල් 225 කි

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

(33) පහත සඳහන් ඉල්ලුම හා සැපයුම් සමීකරණය කුකුල් මස් වෙළඳපලක් ඇත.

$Q_d = 100 – 2P$

$Q_s = - 50 + 2P$

කුකුල් මස් නිෂ්පාදකයාට රු. 03. ඒකක සහනාධාරයක් රජය විසින් දෙනු ලැබේ නම් නිෂ්පාදකයාට ලැබෙන මිල,

1. රු. 42
2. රු. 28
3. රු. 39
4. රු. 36
5. රු. 45

(34) කිසියම් භාණ්ඩයක වෙළඳපල ඉල්ලුම් සැපයුම් තත්ත්ව පහත සමීකරණ වලින් නිරූපණය වේ.

$Q_d = 240 – 2P$

$Q_s = - 36 + 2P$

මෙම භාණ්ඩය මත අයකළ නිෂ්පාදන බද්ද නිසා එහි සැපයුම $Q_s = - 36 + P$ වෙනස් වූයේ නම් බද්දෙන් පසු මෙම භාණ්ඩයේ සමතුලිතයට වන බලපෑම වනුයේ,

2. රුපියල් 50කින් මිල ඉහළ යයි.
3. රුපියල් 02 කින් මිල පහළ බසී.
4. රුපියල් 06 කින් මිල ඉහළ යයි.
5. රුපියල් 06කින් මිල පහළ බසී.
6. රුපියල් 90කින් මිල ඉහළ යයි.

(35) යම් භාණ්ඩයක් වෙළඳපොල සමතුලිත මට්ටමේ පවතී යයි සලකන්න. සමතුලිත මට්ටමට වඩා අඩු සෑම ප්‍රමාණයක දීම සත්‍ය විය හැක්කේ,

1. සෑම මිලකදීම වෙළඳපලේ අධි ඉල්ලුමක් පැවතීම.
2. සැපයුම්කරුවන්ගේ අවම සැපයුම් මිල සමතුලිත මිලට වඩා වැඩි වේ.
3. සෑම මිලකදීම අධි සැපයුමක් පවතී.
4. පාරිභෝගික අතිරික්තය නිෂ්පාදක අතිරික්තයට වඩා වැඩි වේ.
5. සැපයුම්කරුවන් අපේක්ෂා කරන අවම සැපයුම් මිල ගැණුම්කරුවන්ගේ උපරිම ඉල්ලුම් මිලට වඩා අඩු වේ.

(36) සඵල අවම මිලක් සමඟ හිග මුදල් රජය නිෂ්පාදකයාට ලබා දෙයි නම්,

1. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය වැඩි වේ.
2. පාරිභෝගික අතිරික්තය වැඩිවන අතර නිෂ්පාදක අතිරික්තය අඩු වේ.
3. පාරිභෝගික අතිරික්තය අඩුවන අතර නිෂ්පාදක අතිරික්තය අඩු වේ.
4. පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදක අතිරික්තය අඩු වේ.
5. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය ස්ථාවර වේ.

(37) තරගකාරී වෙළඳපලක අලෙවි කරනු ලබන කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සමීකරණයන්ගෙන් පෙන්නුම් කරන බව සලකන්න.

$Q_D = 200 – 4P$

$Q_S = -40 + 2P$

මෙම සමීකරණයෙහි $Q_D$ සහ $Q_S$ පිළිවෙලින් ඉල්ලුම් කරනු ලබන සහ සැපයුම් කරනු ලබන ප්‍රමාණ වන අතර P භාණ්ඩයේ මිල වේ. රජය නිෂ්පාදකයින්ට ඒකකයකට රුපියල් 6 බැඟින් සහනාධාරයක් ලබා දෙනවා යැයි සලකන්න. සහනාධාරය ලබා දුන පසු පාරිභෝගිකයාට ගෙවන්නට සිදුවන මිල කොපමණද?

1. රු. 52
2. රු. 50
3. රු. 42
4. රු. 40
5. රු. 38

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(38) කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය මත පනවනු ලබන වක්‍ර බද්දක් එම භාණ්ඩයේ මිල මත කිසිදු බලපෑමක් ඇති නොකරනුයේ වෙළඳ මිල ඉල්ලුම් වක්‍රය,

1. ඒකීය නම්‍ය වේ.
2. පූර්ණ නම්‍ය වේ.
3. පූර්ණ අනම්‍ය වේ.
4. මිල සමඟ ප්‍රතිලෝම සම්බන්ධයක් ඇත්නම්ය.
5. සැපයුම් වක්‍රයට වඩා අඩු බෑවුමක් සහිත වීම.

(39) එක්තරා භාණ්ඩයකට රජය අවම මිලක් නියම කොට අධි සැපයුම මිලදී ගනු ලැබූ අවස්ථාවක් පහත දැක්වේ.




වෙළඳපලට රජය මැදිහත් වූ පසු සමාජයට අහිමි වූ ශුභ සාධනය වන්නේ,

1. a + b + c
2. c + d
3. i
4. h
5. c + d + g + h

(40) රජය උපරිම මිල ප්‍රතිපත්තියක් සහිත භාණ්ඩයක වෙළඳපල තොරතුරු පහත දැක්වේ. උපරිම මිලෙන් පසුව පැවතිය හැකි සැපයුම් ප්‍රමාණයට වෙළඳපල සමතුලිත වූයේ නම් පාරිභෝගික අතිරික්තය,




1. රු.80
2. රු. 90
3. රු. 100
4. රු. 110
5. රු. 150

(41) කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වෙළඳපල ඉල්ලුම් සැපයුම් වක්‍ර පහත දැක්වේ.




SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

රු.50 වන සේ අවම මිලක් හඳුන්වා දීමටත්, අධි සැපයුම මිලදී ගැනීම මගින් එම මිල පවත්වාගෙන යාමටත් ආණ්ඩුව තීරණය කර තිබේ. මෙබඳු මැදිහත් වීම නිසා ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය වන්නේ,

1. රුපියල් මිලියන 200
2. රුපියල් මිලියන 240
3. රුපියල් මිලියන 360
4. රුපියල් මිලියන 400
5. රුපියල් මිලියන 600

(42) සාමාන්‍ය ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයක් පවතින භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන එක් එක් සිදුවීම් සැලකිල්ලට ගත්විට සත්‍ය වන ප්‍රකාශය,

1. බදු පැනවීමක් හේතු කොටගෙන අධි බදු බරක් ඇතිවේ.
2. සහනාධාර සපයන විට සමාජ ශුභ සාධනය ඉහළ යාම
3. උපරිම මිලක් පැනවූ විට නිෂ්පාදක අතිරික්තය ඉහළ යාම.
4. අවම මිලක් නියම කරන සෑම විටකදීම පාරිභෝගික අතිරික්තය ඉහළ යයි.
5. උපරිම මිල නියම කරන සෑම විටම කළු කඩ මිලක් ඇති වේ.

(43) මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධකයක් ලෙසත් මිල සැපයුම් නම්‍යතාවය තීරණය කරන සාධකයක් ලෙසත් පොදුවේ යොදා ගැනෙන සාධකය කුමක්ද?

1. භාණ්ඩය සඳහා ආදායමෙන් වැයකරන ප්‍රතිශතය
2. භාණ්ඩය නිර්වචනය කොට ඇති ආකාරය
3. භාණ්ඩය සමාජයට අත්‍යවශ්‍යයද යන්න.
4. භාණ්ඩය නිපදවීම සඳහා සාධක සංචලනය කිරීමේ හැකියාව
5. භාණ්ඩය මිල වෙනස් වීමෙන් පසු ගතවන කාලය

(44) $Q_d = 100 - 2PX$ යන ඉල්ලුම් ශ්‍රිතයේ ඉල්ලුම් වක්‍රයේ බෑවුම වන්නේ,

1. - 2
2. 0.5
3. 100
4. 02
5. 50

(45) කිසියම් භාණ්ඩයක අනාගත මිල වැඩි වෙතැයි අපේක්ෂා කරන්නේ නම්,

1. සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
2. සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
3. සැපයුම් වක්‍රය මත ඉහළට ගමන් කරයි.
4. සැපයුම් වක්‍රය මත පහළට ගමන් කරයි.
5. සැපයුම් වක්‍රය දකුණට විතැන් වී වක්‍රය දිගේ ඉහළට ගමන් කරයි.

(46) පහත දැක්වෙන්නේ ඉල්ලුමට අදාළ සංකල්පයන්ය.

A. ඉල්ලුම් න්‍යායය
B. ඉල්ලුම් නීතිය
C. ඉල්ලුම් වක්‍රය
D. ඉල්ලුම් ශ්‍රිතය
E. ඉල්ලුම් ලේඛනය

මිල සහ ඉල්ලුම් ප්‍රමාණ අතර සෘණ සම්බන්ධතාවයක් පෙන්නුම් කරන සංකල්පය පමණක් ඇතුළත් වරණය,

1. A, B, C හා E
2. B, C හා D
3. A, B හා D
4. B, C හා E
5. A, D හා E

SLGURU.LK
For Educational Purpose Only

(47) පොල් සඳහා ඉල්ලුම් සමීකරණය $Q_d = 3000 – 200 P$ මෙම වෙළඳපොලේ පාරිභෝගිකයින් 100 සිටි නම් සාමාන්‍ය එක් පාරිභෝගිකයෙකු ඉල්ලුම් සමීකරණය

1. $Q_d = 30 - 10P$
2. $Q_d = 30 - 2P$
3. $Q_d = 300 - 2P$
4. $Q_d = 3000 - 20P$
5. $Q_d = 100 - 10P$

(48) ඒකීය නම්‍ය සැපයුම් වක්‍රයට මුහුණ දෙන X නමැති භාණ්ඩයේ නිෂ්පාදනය මත 20% බද්දක් පැනවීමේදී ඇති විය හැකි බලපෑම වනුයේ,

1. සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමයි.
2. සැපයුම් වක්‍රය වමට විතැන් වීමයි.
3. සැපයුම් වක්‍රයේ බෑවුම හා අන්තඃඛන්ඩය වෙනස් වේ.
4. සැපයුම් වක්‍රයේ බෑවුම වෙනස් වන අතර අන්තඃඛන්ඩය නොවනස්ව පවතී.
5. සැපයුම් වක්‍රය සරල රේඛීය තත්ත්වයක සිට සරල රේඛීය නොවන තත්ත්වයක පරිවර්තනය වේ.

(49) තරඟකාරී වෙළඳපලක අලෙවි වන කිරිපිටි සඳහා රජය විසින් උපරිම මිලක් නියම කළ පසු ඇති විය හැකි ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ,

1. වෙළඳපලේ කිරිපිටි හිඟයක් ඇතිවීම.
2. කිරිපිටි සඳහා කළුකඩ වෙළඳපලක් ඇතිවීම.
3. කිරිපිටි වෙළඳපල තුළ විරැකියාව ඇතිවීම.
4. සමතුලිත මිලට වඩා ඉහළ මිලක් ඇතැම් විට කිරිපිටි සඳහා ගෙවීමට සිදු වීම.
5. කිරිපිටි මිලදී ගැනීම සඳහා පෝලිම් ක්‍රම හෝ සලාක ක්‍රම ඇති වීම.

(50) එක්තරා ආර්ථිකයක් මත නිශ්චිත සහනාධාරයක් සපයන අවස්ථාවක් පහත දැක්වේ.




බලපෑම වනුයේ,

| අනු අංකය | පාරිභෝගික අතිරික්තය | අහිමි වූ ශුභ සාධනය |
|---|---|---|
| 1. | අඩු වී ඇත | වෙනස් වී නැත |
| 2. | වැඩි වී ඇත | අඩු වී ඇත |
| 3. | වැඩි වී ඇත | වැඩි වී ඇත |
| 4. | වෙනස් වී ඇත | අඩු වී ඇත |
| 5. | වැඩි වී ඇත | වෙනස් වී නැත |

SLGURU.LK



For Educational Purpose Only

"I am still learning." — Michelangelo

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

*සියළු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| ශ්‍රේණිය Grade | 12 | විෂයය Subject | ආර්ථික විද්‍යාව II | කාලය Time | පැය 03 |
|---|---|---|---|---|---|

**("අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)**

**('අ' කොටස)**

**01.** 1. "සියළුම නිෂ්පාදන සාධක ආර්ථික සම්පත් වේ." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 06)
2. ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
3. ස්වභාවික සම්පත් වර්ගීකරණය කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)
4. ශ්‍රම විභජනය සහ විශේෂීකරණය නිෂ්පාදන ක්‍රියාවලියේ ඵලදායිතාවය සඳහා ඉවහල්වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

**02.** 1. "මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී." මෙම ප්‍රකාශය අභිමතානුරූපී ප්‍රකාශයක් ද, නැතහොත් යථානුරූපී ප්‍රකාශයක් ද ? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 04)
2. ආර්ථික පද්ධතියක් යන්නෙන් කුමක් අදහස් කරයි ද ? ආර්ථික පද්ධති අතර වෙනස්කම් දක්නට ලැබෙන්නේ කුමන කරුණු නිසාද ? (ලකුණු 04)
3. වර්තමානයේ "සමාජවාදී වෙළඳපොළ" ආර්ථික පද්ධතිය යන්නෙන් හඳුන්වන්නේ කුමක්ද ? එවැනි ආර්ථික පද්ධති සඳහා නිදසුන් 2 ක් දෙන්න. (ලකුණු 04)
4. විධාන ආර්ථික පද්ධතියක් හා වෙළෙඳපොල ආර්ථික පද්ධතියක් අතර දක්නට ඇති සමානකම් දෙකක් හා අසමානකම් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)
5. "සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමට මිල යාන්ත්‍රණය අසමත් වේ." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද ? හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

**03.** 1. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී භාවිතා කරන උපකල්පන සඳහන් කරන්න. (ලකුණු 04)
2. "වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය" යන්න හඳුන්වා එවැනි තත්ත්වයක් ඇතිවීමට බලපාන හේතු පෙන්වා දෙන්න. (ලකුණු 04)
3. ආර්ථික පසුබැස්ම හා ආර්ථික අවපාතය තත්වයක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතයෙන් පැහැදිලි කරන්න. මෙම අවස්ථාවලදී ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණු 08)
4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් භාවිතයෙන් පහත සඳහන් සිද්ධීන් පැහැදිලි කරන්න.
   i. විශේෂඥ වෛද්‍යවරු බොහෝ පිරිසක් රට අතහැර විදේශ රටවල් වල සේවය සඳහා පිටත්ව යාම.
   ii. ප්‍රවාහන සේවා ප්‍රවර්ධන කිරීම සඳහා බස්, ගුවන් යානා හා දුම්රිය වැනි ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම. (ලකුණු 04)

**('ආ' කොටස)**

**04.** 1. භාණ්ඩයක මිල පහල යන විට පාරිභෝගිකයන් එම භාණ්ඩය වැඩියෙන් ඉල්ලුම් කරන්නේ ඇයි ? (ලකුණු 04)
2. "මිල ප්‍රතිවිපාකය" යන්න හඳුන්වා බාල භාණ්ඩයක මිල පහළ යාමේදී මිල ප්‍රතිවිපාකය ක්‍රියාත්මක වන ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

3. සළාකනය සඳහා යොදා ගැනෙන මිල නොවන මාධ්‍යයන් මොනවාද ? (ලකුණු 04)

4. නිදහස් තරඟකාරි වෙළෙඳපොළක ඉල්ලුම් ශ්‍රිතය Qd = 100-2P වන අතර පූර්ණ නම්‍ය සැපයුමක් පවතී. වෙළෙඳපොල සමතුලිත ප්‍රමාණය ඒකක 50 කි.

   i. සමතුලිතය ප්‍රස්තාරයේ පෙන්වා සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

   ii. රජය නිෂ්පාදකයින්ට රු.10/- ඒකක බද්දක් පැනවුවහොත් බද්දෙන් පසු මුළු ආර්ථික අතිරික්තය හා අහිමි වන ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 04)

**05.** 1. සැපයුම නීතිය යන්න නිර්වචනය කොට සැපයුම කෙරෙහි බලපාන මිල නොවන සාධක සඳහන් කරන්න. (ලකුණු 04)

2. තරගකාරී වෙළෙඳපොලක අලෙවිවන එක්තරා භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

   Qd = 14 - P

   Qs = -2 + P

   i. සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

   ii. සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව හා ව්‍යාපාරික අයභාරය ගණනය කරන්න. (ලකුණු 02)

   iii. මෙම භාණ්ඩ විකිණිය හැකි උපරිම මිල රු.5/- ක් ලෙස රජය තීරණය කළේ නම් වෙළෙඳපලෙහි ඇතිවිය හැකි ප්‍රතිවිපාක 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

3. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ වේ.

   Qd = 1000-20P

   Qs = -200+20P

   i. වෙළෙඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

   ii. රජය මෙම භාණ්ඩය සඳහා ඒකකකයක් මත රු.20/- ක නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන්නේ නම් සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

   iii. සහනාධාරය සඳහා රජයේ පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02)

   iv. සහනාධාරය ලබාදීම නිසා ඇතිවන අහිමිවන සුභසාධනය ගණනය කරන්න.(ලකුණු 02)

**06.** 1. ඉල්ලුම් වක්‍රයක් මත සෑම ලක්ෂයකම එක සමාන නම්‍යතා සංගුණකයන් පෙන්නුම් කරන සුවිශේෂී අවස්ථා පෙන්වා දෙන්න. (ලකුණු 03)

2. ආදායම් වියදම් නම්‍යතාව යන්නෙන් කුමක් අදහස් කෙරේද ? මෙම නම්‍යතාවයේ ඇති ප්‍රායෝගික වැදගත්කම කවරේද ? (ලකුණු 04)

3. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් සැපයුම් සමීකරණ දෙකකි.

   Qd = 2-5P

   Qs = -50+5P

   i. රජය මෙම භාණ්ඩය මත රු.35/- ක සහතික මිලක් පනවා අතිරික්ත සැපයුම් මිලදී ගත්තේ නම් පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 05)

   ii. මේ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද ? (ලකුණු 02)

   iii. රජයේ මෙම මැදිහත්වීම නිසා සමාජයට අහිමිවන සුභසාධනයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

4. වෙළෙඳපොලෙහි කාර්මික භාණ්ඩවලට වඩා කෘෂිකාර්මික නිෂ්පාදිත වල මිල ගණන් උච්ඡාවචනය වන්නේ ඇයි ? මෙම තත්වය වලක්වා ගැනීමට මිල ස්ථායිකරණය සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ? (ලකුණු 04)

**07.** 1. නිෂ්පාදනයේ කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස නිෂ්පාදන ශ්‍රිතයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 04)

2. ''හීනවන ඵලදා න්‍යාය''යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? යන්න පැහැදිලි කර සාමාන්‍ය ඵලදා වක්‍රය හා ආන්තික ඵලදා වක්‍රයේ හැසිරීම පෙන්වා දෙන්න. (ලකුණු 04)

3. ''වැඩිවන පරිමාණානුකූල ඵල'' යන්න පැහැදිලි කර මහා පරිමාණ පිරිමැසුම් හටගැනීමෙහි ලා බලපාන සාධක පෙන්වා දෙන්න. (ලකුණු 04)

4. ආර්ථික ලාභය හා ගණකාධිකරණ ලාභය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

5. ගිළුණු පිරිවැය යන්න හඳුන්වා ඒ සඳහා නිදසුන් 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

SLGURU.LK



For Educational Purpose Only

“I am still learning.” — Michelangelo

Visit SLGURU.LK to download papers and notes.